සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

10 ශ්‍රේණිය

නාට්‍ය හා රංග කලාව - I පත්‍රය

කාලයඃ- පැය 03 කි.

නම / විභාග අංකයඃ-..............................................................

- ප්‍රශ්න සියල්ලටම පිළිතුරු සපයන්න. දී ඇති වරණ අතුරින් නිවැරදි හෝ වඩාත් ගැලපෙන වරණය තෝරා යටින් ඉරක් අඳින්න

(01) කතාන්දරය හා නාට්‍ය පිළිබඳ වැරදි ප්‍රකාශය වන්නේ

(1) කතාන්දරයට ද නාට්‍යයට ද තේමාවක් ඇත

(2) කතාන්දරයක ගැටුම් අවස්ථා නොමැති අතර නාට්‍යයක ද ගැටුම් අවස්ථා නිසා රස වින්දනයට බාධා ඇති වේ

(3) කතාන්දරයක හා නාට්‍යයක චරිත ඇතුලත්ව ඇත

(4) කතාන්දරයක සිදුවීම් අනුපිළිවෙලින් සිදු වුවද නාට්‍යයක සිදුවීම්වල අනුපිළිවෙලක් අත්‍යාවශ්‍ය නොවේ

(02) දෘශ්‍ය කලා මාධ්‍ය යුගලයක් වන්නේ

(1) චිත්‍ර හා කැටයම් (2) බැලේ හා ඔපෙරා (3) චිත්‍ර හා නර්තනය (4) මූර්ති හා වාදනය

(03) අනෙකුත් ප්‍රසාංගික කලාවන්ට වඩා වේදිකා නාට්‍ය සුවිශේෂී කලාවක් වනුයේ

(1) වේදිකාවක් මත ඉදිරිපත් කරන නිසාවෙනි (2) ප්‍රේක්ෂක සහභාගීත්වය අත්‍යවශ්‍ය නිසාවෙනි

(3) පෙළ සාහිත්‍යයන් දක්නට ලැබෙන නිසාවෙනි (4) රස වින්දනය ප්‍රධාන පරමාර්ථය වූ නිසාවෙනි

(04) පහත දැක්වෙන කලාවන් අතුරින් ප්‍රාසාංගික කලාවන් පමණක් ඇතුලත් පිළිතුර වනුයේ

(1) සංගීතය , ඔපෙරා , කැටයම් (2) චිත්‍ර , බැලේ , නර්තනය

(3) සංගීතය , නාට්‍ය , නර්තනය (4) මූර්ති , චිත්‍රපට , නාට්‍ය

(05) රූපවාහිනී නාට්‍යයක් හා වේදිකා නාට්‍යයක් පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වනුයේ

(1) රූපවාහිනී නාට්‍ය කොටස් වශයෙන් විකාශනය වන අතර වේදිකා නාට්‍ය එසේ නොවේ

(2) රූපවාහිනී නාට්‍ය කලින් රූපගත කර විකාශනය කරන අතර වේදිකා නාට්‍යයද එසේ සිදු කල හැකිය

(3) රූපවාහිනී නාට්‍ය සජීවී නොවන අතර වේදිකා නාට්‍ය සජීවී කලාවකි

(4) රූපවාහිනී නාට්‍ය ප්‍රදර්ශනය වන සෑම අවස්ථාවකදීම ශිල්පියාට ප්‍රතිලාභ නොලැබුනද වේදිකා නාට්‍යයේ ප්‍රදර්ශනය වන සෑම අවස්ථාවකම ශිල්පියාට ප්‍රතිලාභ ලැබේ

(06) නාට්‍යය යන්නට නොගැලපෙන පිළිතුර වනුයේ

(1) ලොව ඉපැරණිතම කලාවන්ගෙන් එකකි (2) තනි පුද්ගල නිර්මාණයකි

(3) ජීවිතයේ නියත අනුකරණයක් නොවේ (4) ප්‍රේක්ෂකයා අනිවාර්ය සාධකයකි

(07) ප්‍රාසාංගික කලාව යනු

(1) සංගීතය, නර්තනය, චිත්‍ර හා සැරසිලි යන කලාවන්ගේ එකතුවකි

(2) රූපවාහිනී රියැලිටි වැඩසටහන් මගින් ඉදිරිපත් කරන සංගීත හා නර්තන ප්‍රසංගයි

(3) ප්‍රේක්ෂක පිරිසක් ඉදිරියේ සජීවීව ඉදිරිපත් කරන කලාවන් ය

(4) නළු නිලියන් කලින් පටිගත කොට ඉදිරිපත් කරන කලාවන්ය

(08) නළුවෙකු තමාගේ පරිකල්පන ශක්තිය මෙහෙයවා උත්පාදනය කරන චලන රටා .......................... ලෙස හඳුන්වයි. මෙහි හිස්තැනට ගැලපෙන පිළිතුර වනුයේ

(1) ස්වාභාවික චලන (2) රිද්මයානුකූල චලන (3) නිර්මිත චලන (4) ක්‍රීඩාශීලි චලන

(09) රංග ක්‍රීඩාවක් නොවේ

(1) මකර වලිගය (2) මීයා හා පූසා (3) දූපතට ගොඩවීම (4) හිමකන්ද දියවීම

(10) නොගැලපෙන සම්බන්ධය තෝරන්න

(1) හුණුවටයේ කතාව - හෙළ ගැඹුරුයි පුත නොබලන්

(2) මනමේ නාටකය - ලප නොමවන් සඳ සේ සොමි ගුණෙනා

(3) තල මල පිපිලා - සුමුදු නිදි කුමරි

(4) තාරාවෝ ඉගිලෙති - බෝමා ජාති ඇත බෝ වී

(11) නළුවෙකුට දීර්ඝ සංවාද ඛණ්ඩ නිවැරදිව හා පැහැදිලිව උච්ඡාරණය කිරීමේ හැකියාව ප්‍රගුණ කිරීමට සුදුසු අභ්‍යාසය වන්නේ

(1) සංවේදන අභ්‍යාස (2) ශ්වසන අභ්‍යාස (3) මානසික අභ්‍යාස (4) ශිථිලකරණ අභ්‍යාස

(12) නළුවරණයේදී අධ්‍යක්ෂකවරයාගේ අවධානයට ලක් විය යුතු කරුණක් නොවේ

(1) නාට්‍යයේ එන චරිතයට ගැලපෙන බාහිර පෙනුම (2) නළුවාගේ ශිල්පීය අත්දැකීම්

(3) ශිල්පියාගේ රූපණ හැකියාව (4) නළුවාගේ පෞද්ගලික ආශාවන්

(13) නාට්‍ය ගීත ගායනය කිරීමේදී අවධානයට ගත යුතු කරුණක් වනුයේ

(1) පැහැදිලිව වචන උච්ඡාරණය කිරීම

(2) ප්‍රේක්ෂකාගාරයට ගැලපෙන සේ ගීතයේ වෙනස්කම් කරමින් ගායනය දිගු කිරීම

(3) ප්‍රේක්ෂකාගාරය කුල්මත් කරමින් ගායනා කිරීම

(4) ගායනය අතර උපරිම ලෙස නර්තනයේ යෙදීම

(14) දකුණුපස ඡායාරූපයෙන් දැක්වෙන රංග ශාලාව වනුයේ



(1) නෙළුම් පොකුණ රඟහල

(2) එල්ෆින්ස්ටන් රඟහල

(3) ටවර් හෝල් රඟහල

(4) ලයනල් වෙන්ට්ඩ් රඟහල


(15) දකුණුපස ඡායාරූපයෙන් දැක්වෙන අවස්ථාව සම්බන්ධ නිවැරදි පිළිතුර වනුයේ

(1) මෙය ගීත නාට්‍යයක ජවනිකාවකි

(2) පණිභාරත මහතා විසින් නිර්මාණය කරන ලද්දකි

(3) ඩබ්ලිව්.ඩී අමරදේවයන්ගේ සංගීත නිර්මාණ ඇතුලත්ය

(4) මෙය බටහිර බැලේ නාට්‍යයක අවස්ථාවකි




(16) දකුණුපස ඡායාරූපය සම්බන්ධ ගැලපෙන ප්‍රකාශය තෝරන්න

(1) මෙය තබ්ලාව නම් සංගීත භාණ්ඩයයි

(2) ශාන්තිකර්ම සඳහා ප්‍රහලව භාවිත කරයි

(3) බටහිර නාට්‍යවලට වැඩි වශයෙන් යොදා ගනී

(4) දිත්තල කාලගෝල නාටකයේ ප්‍රහලව භාවිත වේ



(17) පුද්ගලයන් දෙදෙනෙකු ඇස්වල සම්බන්ධතාවය ඍජුව පවත්වා ගැනීම සඳහා පුහුණු කල යුතු රංග අභ්‍යාසය වන්නේ

(1) සංවේදන අභ්‍යාස (2) දර්පණ අභ්‍යාස (3) කටහඬ අභ්‍යාස (4) ශරීලකරණ අභ්‍යාස

(18) රංග භූමියක තිබිය යුතු මූලික අවශ්‍යතා සම්බන්ධයෙන් වඩාත් ගැලපෙන පිළිතුර තෝරන්න

(1) සමතලා භූමියක් හා ප්‍රමාණවත් අවකාශයක් තිබීම

(2) පසුතල ඉදිකිරීම සඳහා ප්‍රමාණවත් අවකාශයක් තිබීම

(3) සංගීත ශිල්පීන් සඳහා විශේෂ ස්ථානයක් තිබීම

(4) ශිල්පීන්ට සැපපහසු වන පරිදි නිර්මාණය කර තිබීම

(19) සිරුර සම්බන්ධ සංවේදන අභ්‍යාස මගින්

(1) යමක් රසබලා එය කුමක්දැයි පැවසිය හැකිය

(2) යමක් ස්පර්ශ කොට එය කුමක්දැයි අවබෝධ කරගත හැකිය

(3) යමක් ආවර්ජනය කොට එය කුමක්දැය පැවසිය හැකිය

(4) යමක් ආඝ්‍රාණය කොට එය කුමක්දැයි පැවසිය හැකිය

(20) අංග රචනා අමුද්‍රව්‍ය යොදා ගන්නා ආකාරය සම්බන්ධයෙන් නොගැලපෙන වරණය තෝරන්න

(1) ක්‍රේප්හෙයාර් - රැවුල් සඳහා භාවිතා කරයි

(2) නෝස් පොටි - මුහුණේ විවිධ හැඩ සැකසීමට භාවිතා කරයි

(3) ස්ප්‍රීතුගම් - රැවුල් ඇලවීමට යොදා ගනී


(4) රිමුවින් ක්‍රීම් - මුහුණේ පැහැය වැඩි කිරීමට යොදා ගනී

(21) රංග භාණ්ඩ සම්බන්ධයෙන් වැරදි ප්‍රකාශය වන්නේ,

(1) සෑම වේදිකා නාට්‍යයකම දැකිය හැකිය (2) නළුවාට පහසුවෙන් පරිහරණය කලහැකි විය යුතුය

(3) නාට්‍යයේ ශෛලියට ගැලපිය යුතුය (4) සරල සහ සැහැල්ලු විය යුතුය

- (22) සිට (24) දක්වා ප්‍රශ්න සඳහා පහත ඡායාරූප භාවිත කරන්න


A


B


C


D

(22) සූනියම් යාගය හෙවත් මැණිකපාල ශාන්තිය හා සම්බන්ධ වේ

(1) A හා D (2) A හා B (3) B හා C (4) C හා D

(23) D ඡායාරූපයෙන් දැක්වෙන්නේ

(1) ගැටබෙරය (2) ඩොලැක්කිය (3) පහතරට බෙරය (4) දවුල

(24) C ඡායාරූපයෙන් දැක්වෙන්නේ

(1) බිහිරි සන්නියයි (2) සළු පාලියයි (3) අමුක්කු සන්නියයි (4) පන්දම් පාලියයි

- (25) සිට (26) දක්වා ප්‍රශ්න සඳහා ගැලපෙන පිළිතුර තෝරන්න

(25) (1) දීකිරි දීකිරි - තාරාවෝ ඉගිලෙති (2) මූදු පතුල යට ඉඳලා - හුණුවටයේ කතාව

(3) ඇහැල මලින් ගස් පිරිලා - නරිබෑණා (4) ප්‍රේමයෙන් මන රංජිතවේ - සිංහබාහු

(26) (1) ඇගේ නම සෙම්බරිය ස්වාමීනි - දික්පිටියා

(2) නුඹගේ ස්ත්‍රියගේ නම කුමක්ද - කාලගෝල

(3) මේ තැනැත්තා පමණක් සිටියදී අනෙක් දෙදෙනා වෙන්ව තබනු - චක්තුදත්ත

(4) ඇගේ නම රම්බරීය හාමුදුරුවනේ - දික්තලා

- (27) සිට (28) දක්වා ප්‍රශ්න සඳහා නොගැලපෙන පිළිතුර තෝරන්න

(27) (1) කාලගෝලයාගේ අංග රචනය - ආහාර්ය අභිනය

(2) දික්තලා මුහුණෙන් අකමැත්ත හා පසුතැවීම නිරූපණය කිරීම - සාත්වික අභිනය

(3) දික්තලා දික්පිටියා සමග ගඟෙන් එතෙරවීම නිරූපණය - ආංගික අභිනය

(4) මහෞෂධ පඬිවරයාගේ ඇඳුම් පැළඳුම් - වාචික අභිනය

(28) (1) මනමේ නාට්‍යය - නාට්‍යධර්මී සම්ප්‍රදාය

(2) තලමල පිපිලා - ලෝකධර්මී සම්ප්‍රදාය

(3) සිංහබාහු - ලෝකධර්මී සම්ප්‍රදාය

(4) ජනේලය - ශෛලිගත සම්ප්‍රදාය

- (29) සිට (33) දක්වා ප්‍රශ්න සඳහා පහත වගුව භාවිත කරන්න

| මෙරට නිෂ්පාදනයේ නම | එම පරිවර්තකකයා | මුල් කෘතියේ නම | මුල් කෘතියේ නිර්මාණකරු |
|---|---|---|---|
| මකරා | A | ඩ්‍රැගන් | එව්ජිනි ෆ්වාන්ස් |
| අහස් මාලිගා | හෙන්රි ජයසේන | ග්ලාස් මෙනාජරි | B |
| හුණුවටයේ කතාව | C | කොකේසියන් චෝක් සර්කල් | D |
| E | සුගතපාල ද සිල්වා | ''ද හෝස්'' | ජුලියස් හේ |
| මරාසාද් | F | මරාසාද් | පීටර් වයිස් |

(29) A හා C අක්ෂර සඳහා පිළිතුර වන්නේ,

(1) සයිමන් නවගත්තේගම (2) එදිරිවීර සරත්චන්ද්‍ර (3) හෙන්රි ජයසේන (4) පරාක්‍රම නිරිඇල්ල

(30) B අක්ෂරය සඳහා ගැලපෙන පිළිතුර වන්නේ,

(1) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (2) ටෙනිසි විලියම්ස්

(3) ඇලෙක්සැන්ඩර් බ්‍රෙෂෝට් (4) ෂෙරිඩන්

(31) D අක්ෂරයට අදාල නම වන්නේ,

(1) ඔස්කා වයිල්ඩ් (2) බර්ටෝල්ට් බ්‍රෙෂ්ට් (3) ටෙනිස් විලියම්ස් (4) ලුයිජි පිරැන්ඩලෝ

(32) E සඳහා ගැලපෙන නාට්‍ය නිර්මාණය වනුයේ,

(1) තුරඟ සන්නිය (2) දුන්නදුනු ගමුවේ (3) ඇසල සඳ අවන්හල (4) හරිම බඩු හයක්

(33) මරාසාද් නාට්‍ය නිර්මාණය කල F අක්ෂරය සඳහා සුදුසු මෙරට නාට්‍ය නිර්මාණකරුවා වනුයේ,

(1) හෙන්රි ජයසේන (2) පරාක්‍රම නිරිඇල්ල (3) බන්දුල ජයවර්ධන (4) සුගතපාල ද සිල්වා


(34) පහත නාට්‍යකරුවන් අතුරින් ස්වතන්ත්‍ර නාට්‍ය පමණක් නිර්මාණය කල නාට්‍යකරුවා වනුයේ,

(1) සුගතපාල ද සිල්වා (2) පරාක්‍රම නිරිඇල්ල (3) හෙන්රි ජයසේන (4) සයිමන් නවගත්තේගම

- (35) සිට (40) සඳහා පහත රංගනවේදීන්ගේ ඡායාරූප භාවිත කරන්න


G


H


I


J


K


L

(35) H ඡායාරූපයේ සිටින රංගන ශිල්පියා සම්බන්ධ සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

(1) නාට්‍ය අධ්‍යක්ෂණයේ ද නිරත විය

(2) සිනමා හා ටෙලිනාට්‍ය නළුවකු ලෙස කැපී පෙනෙන රංගන ශිල්පියෙකි

(3) වඩාත් ප්‍රකට හාස්‍ය රංගනය සඳහාය

(4) නාට්‍ය පරිවර්තනය සම්බන්ධයෙන් කීර්තිමත් නමක් දිනා සිටි

(36) මහාචාර්ය නෝර්බට් ජේ මයර් නම් නාට්‍යකරුවාගේ නාට්‍ය වැඩමුළුවක් හරහා ක්ෂේත්‍රයට පිවිසි නළුවා අයත් ඡායාරූපය

(1) H (2) I (3) K (4) L

(37) G ඡායාරූපයේ සිටින මානෙල් ජයසේන රංගවේදිනිය සම්බන්ධයෙන් සාවද්‍ය ප්‍රකාශය තෝරන්න

(1) කුවේණි නාට්‍යයේ කුවේණියයි
(2) හුණුවටයේ නාට්‍යයේ ගෲෂාය

(3) සිංහබාහු නාට්‍යයේ සුප්පාදේවියයි
(4) හෙන්රි ජයසේන මහතාගේ බිරිඳයි

(38) J ඡායාරූපයේ සිටින රංගවේදිනිය රංගනයෙන් දායක වූ නාට්‍ය නිර්මාණයක් වනුයේ,

(1) රතු හැට්ටකාරී (2) ජනේලය (3) බල්ලොත් එක්ක බෑ (4) තලමල පිපිලා

(39) සිංහල හා ඉංග්‍රීසි නාට්‍ය වේදිකාවේ රංගනයෙන් දායක වූ හුණුවටයේ කථාව, කුවේණි, TAMMING OF THR SHREW, THE WEDDING ආදී නාට්‍යවල රංගනයෙන් දායක වූ රංගන ශිල්පියා වනුයේ,

(1) H (2) I (3) K (4) L

(40) K ඡායාරූපයේ සිටින රංගනවේදියා පිළිබඳ සාවද්‍ය ප්‍රකාශය වන්නේ,

(1) සිනමා, රූපවාහිනි නාට්‍ය අධ්‍යක්ෂකවරයෙකු වශයෙන් කටයුතු කරයි

(2) සලංහන්තේ, ගඟ දිගේ වැනි සඟරාමය වාර්ථා වැඩසටහන් නිර්මාණය කරන ලදී

(3) රූපවාහිනි ප්‍රවෘත්ති නිවේදකයකි

(4) මෙතනින් මාරු වෙනු, තාරාවෝ ඉගිලෙති, අන්, මෝරා, මරාසාද් වැනි නාට්‍ය නිර්මාණවල රංගනයෙන් දායක වී ඇත

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

**10 ශ්‍රේණිය**

**නාට්‍ය හා රංග කලාව - II පත්‍රය**

නම / විභාග අංකය:-.................................................................

- පළමුවන ප්‍රශ්නය ඇතුළුව ප්‍රශ්න පහකට පිළිතුරු සපයන්න

(01) පහත දැක්වෙන ඡායාරූප අවස්ථාව ඇසුරු කර ගනිමින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න



(1) ඉහත ඡායාරූපය අදාල නාටකය සහ එහි පෙළ රචකයා නම් කරන්න (ලකුණු 2)

(2) එම ඡායාරූපයේ පෙනී සිටින චරිත දෙක නම් කරන්න (ලකුණු 2)

(3) මෙහි එන කාන්තා චරිතයේ එන චරිත ලක්ෂණ දෙකක් සඳහන් කරන්න (ලකුණු 2)

(4) මෙම නාටකය නිර්මාණය කිරීම සඳහා ඇසුරු කොටගෙන ඇති ගැමි නාටක සම්ප්‍රදාය කුමක් ද? (ලකුණු 2)

(5) මෙම නාටකයේ ප්‍රධාන චරිත දෙක එකිනෙකා සමග නොගැලපීමට හේතුවන කරුණු දෙකක් සඳහන් කරන්න (ලකුණු 2)

(6) මෙම නාටකයේ භාවිතාවන සංවාදවල දක්නට ලැබෙන විශේෂ ලක්ෂණ දෙකක් සඳහන් කරන්න (ලකුණු 2)

(02)

(1) නෘක්ත හා නෘත්‍ය යන්න හඳුන්වන්න (ලකුණු 2)

(2) නෘත්ත හා නෘත්‍ය සඳහා උදාහරණ දෙක බැගින් ලියන්න (ලකුණු 4)

(3) නෘත්ත, නෘත්‍ය හා නාට්‍ය සඳහා පොදු වූ අභිනයන් පිළිබඳව සඳහන් කරන්න (ලකුණු 6)

(03)

(1) ක්ෂණික නිරූපණය යනු කුමක්දැයි කෙටියෙන් සඳහන් කරන්න (ලකුණු 2)

(2) ක්ෂණික නිරූපණයේ ඇති වැදගත්කම කෙටියෙන් පෙන්වා දෙන්න (ලකුණු 4)

(3) රූපණය ප්‍රගුණ කරන්නා විසින් ක්ෂණික නිරූපණ අවස්ථාවක් ගොඩනගා ගැනීමේදී ඔහු විසින් අවධානයට ගතයුතු කරුණු මොනවාද? (ලකුණු 6)

(04)

(1) අංග රචනය මූලික වශයෙන් බෙදන ප්‍රධාන කොටස් දෙක නම් කරන්න (ලකුණු 2)

(2) එම කොටස් දෙක හඳුන්වන්න (ලකුණු 4)

(3) වේදිකා නාට්‍යයක් සඳහා අංග රචනය අවශ්‍ය වන්නේ කුමක් නිසාදැයි පැහැදිලි කරන්න (ලකුණු 6)

(05)



(1) ඉහත ඡායාරූප අවස්ථාව හා බැඳි පහතරට ශාන්තිකර්මය නම් කරන්න (ලකුණු 3)

(2) එම ශාන්තිකර්මය පැවැත්වීමේ අරමුණු තුනක් සඳහන් කරන්න (ලකුණු 3)

(3) ඉහත ඡායාරූපය හා බැඳි ශාන්තිකර්මයේ අන්තර් රංග අවස්ථා දෙකක් නම් කරන්න. එම අන්තර් රංග අවස්ථා ආශ්‍රිතව දැකිය හැකි නාට්‍යමය ලක්ෂණ හතරක් විස්තර කරන්න (ලකුණු 6)

(06) ''හනික වරෙව් කොල්ලනේ මෙන්න මෙහෙ වරෙව්...//

මෙන්න මෙහෙ වරෙව් කොල්ලනේ නට නටා වරෙව්''

(1) මෙම ගීතය අයත් වේදිකා නාට්‍යයේ නම සහ අධ්‍යක්ෂකවරයා නම් කරන්න (ලකුණු 4)

(2) එම නාට්‍යකරුවාගේ නාට්‍ය නිර්මාණ හතරක් නම් කරන්න (ලකුණු 4)

(3) ඔහු විසින් රචනා කරන ලද ශාස්ත්‍රීය ග්‍රන්ථ හතරක් නම් කරන්න (ලකුණු 4)

(07) දරිද්‍රතාවයෙන් පෙළෙන පවුලක වැඩිමහලු දරුවා වන කසුන් 11 ශ්‍රේණියේ අධ්‍යාපනය ලබයි. ඔන්ලයින් අධ්‍යාපනය සඳහා ඉතා අපහසුවෙන් මිලදී ගන්නා ජංගම දුරකථනයෙන් ඔහු නිවැසියන්ට හොර රහසේ සමාජ මාධ්‍ය ජාලා තුළ සැරිසරයි. මෙය කසුන්ගේ මවගේ අතට හසුවීමෙන් පසු ............

මෙම සිදුවීම පාදක කරගෙන කෙටි නාට්‍යක් රචනා කරන්න

නාට්‍යමය සිද්ධි ගොඩනැගීම (ලකුණු 4)

චරිත, අවස්ථා, සිද්ධි කලමනාකරණය (ලකුණු 4)

ප්‍රබල සංවාද භාවිතය හා රංග විධාන භාවිතය (ලකුණු 4)

සියලුම හිමිකම් ඇවිරිණි
முழுப் பதிப்புரிமையுடையது.
All Rights Reserved

# දකුණු පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

## අවසාන වාර පරීක්ෂණය - 2020

### 10 - ශ්‍රේණිය

### නාට්‍ය හා රංග කලාව - පිළිතුරු

**i පත්‍රය**

| | | | |
|---|---|---|---|
| (01) 2 | (11) 2 | (21) 1 | (31) 2 |
| (02) 1 | (12) 4 | (22) 1 | (32) 1 |
| (03) 3 | (13) 1 | (23) 3 | (33) 4 |
| (04) 3 | (14) 3 | (24) 2 | (34) 4 |
| (05) 2 | (15) 3 | (25) 3 | (35) 4 |
| (06) 2 | (16) 4 | (26) 1 | (36) 2 |
| (07) 3 | (17) 2 | (27) 4 | (37) 3 |
| (08) 3 | (18) 1 | (28) 3 | (38) 1 |
| (09) 4 | (19) 2 | (29) 3 | (39) 4 |
| (10) 4 | (20) 4 | (30) 2 | (40) 3 |

**ii පත්‍රය**

(01)

(1) දික්තල කාලගෝල නාටකය

චාල්ස් ද සිල්වා ගුණසිංහ ගුරුන්නාන්සේ

(2) දික්තලා හා කාලගෝලයා

(3) අකමැති පුද්ගලයෙකු විවාහ කරදීම පිළිබඳව තම දෙමාපියන්ට දොස් නැගීම
ඉතා රූමත් හා රූපය ගැන ආඩම්බර වන අයෙකු වීම
තම විවාහය පිළිබඳව පසුතැවිලි වීම

(4) නාඩගම්

(5) වයස් පරතරය
දෙදෙනාට සාපේක්ෂව බාහිර රූපය නොගැලපීම
කාලගෝල දික්තලාට කැමති වුවද දික්තලා ඔහුට අකමැති වීම
දෙමාපියන්ගේ අවශ්‍යතාව නිසා අකමැත්තෙන් විවාහය කරදීම

(6) තාලානුකූල හා රිද්මයානුකූලව උච්ඡාරණය කිරීම
වියත් බස් වහර හා ගැමි බස් වහර මිශ්‍රව යොදා ගැනීම
හාස්‍ය රසය ඉස්මතු වන පරිදි සංවාද රචනා කිරීම
කෙටි වාක්‍ය ස්වභාවයෙන් රචනා කිරීම

(02)

(1) නෘත්ත හා නෘත්‍ය හඳුන්වා තිබීම

(2) නෘත්ත - ලී කෙළි, තාලම්, සවරම්, පන්තේරු, ශුද්ධ මාත්‍රා, තෙල්මෙ නැටුම, වෙස් නැටුම ආදී 2ක් සඳහන් කර තිබීම

නෘත්‍ය - භරත නාට්‍යම්හි ශිව පාර්වතී කතාව, කතක් නර්තනය, කතකලි නර්තනය, මනිපුරි නර්තනය ආදී 2ක් සඳහන් කර තිබීම

(3) නෘත්ත - සතර අභිනයම නැත

නෘත්‍ය - ආංගික හා සාත්වික අභින ප්‍රධානව ඇත

නාට්‍ය - සතර අභිනයම ප්‍රධානව ඇත

(03)

(1) පිටපතකින් තොරව සීමිත කාලයක් තුල දෙන ලද ඉඟියකට අනුව රූපණය ප්‍රධාන කරගනිමින් කිසියම් අවස්ථාවක් නිරූපණය කිරීම

(2) ආධුනික නළුවෙකුට සිය රූපණ හැකියාව දියුණු කර ගැනීමට
රූපණ ශිල්පියාගේ දක්ෂතා මැන ගැනීමට
නවක නළුවන් තෝරා ගැනීමට
නිර්මාපී චින්තනය දියුණු වීම
ක්ෂණික තීරණ ගැනීම හා ක්‍රියාත්මක වීම ආදිය සඳහන් කර කෙටියෙන් විස්තර කර තිබීම

(3) දෙන ලද මාතෘකාවට නව අර්ථකථනයන් දෙමින් පරිකල්පනය තුළින් කතාව සැකසීම
මුල, මැද, අග මනාව සංවිධානය කර ගැනීම
මාතෘකාවට ගැලපෙන පරිදි චරිත ගොනු කිරීම
නාට්‍යමය අවස්ථාවට ගැලපෙන පරිදි සංවාද ගොඩ නැගීම

(04)

(1)
(2)
(3)
} 3.4.1 හා 3.4.2 අධ්‍යනය කරන්න.
ඒ අනුව ලකුණු ලබා දෙන්න

(05)

(1) රිද්දියාගය හෙවත් රට යකුම

දොළහ පෙළපාලි යාගය

(2) කාන්තාවන්ගේ වඳභාවය නැති කිරීම
ගර්භණී කාන්තාවන්ගේ ගර්භය ආරක්ෂා කිරීමට
ප්‍රසූතියේදී මවට මානසික ශක්තිය ලබා දීමට
අළුත උපන් බිළිදාගේ ආරක්ෂාවට ආදී කරුණු තුනක් සඳහා ලකුණු ලබා දෙන්න

(3) නානුමුරය (දොළහ පෙළපාලිය)

කපුයක් කාරිය

දරු නැලවිල්ල

මෙහි අඩංගු ඕනෑම නාට්‍යමය ලක්ෂණ හතරක් උදාහරණ සහිතව විස්තර කල යුතුය

(06)

(1)
(2) 4.2.3 පරිශීලනය කරන්න.
(3)